# 2022 වර්ෂයේ අහිමිවූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan for Learning Loss - 2022)

## - 11 ශ්‍රේණිය

(11 ශ්‍රේණියේ පළමුවාරයේ කාලච්ඡේද 37 ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වා ගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළපොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **11 ශ්‍රේණිය පළමුවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| නිපුණතාව **1.0:** ජෛව පද්ධතිවල ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ජීවය හා ජෛව ක්‍රියාවලි ගවේෂණය කරයි. | | | | | | |
| 1.0 | 1.1<br><br>ශාක පටකවල ලාක්ෂණික අනාවරණය කරයි. | • විභාජක හා ස්ථිර පටකවල ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• මෘදුස්තර, ස්ථුලකෝණාස්තර සහ දෘඪස්තර යන පටක 'සරල ස්ථිර පටක' ලෙස නම් කරයි.<br>• සෛලම සහ ප්ලෝයම යන පටක සංකීර්ණ ස්ථිර පටක ලෙස නම් කරයි.<br>• සෛල මහා ප්ලෝයම පටක ඒවායේ විශේෂ ලක්ෂණ භාවිතයෙන් සංකීර්ණ ස්ථිර පටක ලෙස හඳුනා ගනියි. | • පටක<br>  • ශාක පටක<br>    • විභාජක පටක<br>    • ස්ථිර පටක<br>      • සරල පටක<br>      • සංකීර්ණ පටක | පිටු අංක 1 - 2 | ජීවීපටක (ශාක පටක 1-9) | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළපොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | 1.2<br><br>සත්ත්ව පටකවල ලාක්ෂණික අනාවරණය කරයි | • ප්‍රධාන සත්ත්ව පටක ලෙස අපිච්ඡද සම්බන්ධක පේශි හා ස්නායු පටක හඳුන්වා දෙයි.<br>• අපිච්ඡද පටකවල කෘත්‍යය හා පිහිටි ස්ථාන ප්‍රකාශ කරයි.<br>• රුධිරය සම්බන්ධක පටකයක් බව විස්තර කරයි.<br>• සිනිඳු, කංකාල හා හෘත් පේශි පටකවල කෘත්‍ය හා පිහිටි ස්ථාන ප්‍රකාශ කරයි.<br>• හැඩය අනුව පේශි පටක හඳුනාගනී.<br>• ස්නායු සෛලයේ ව්‍යුහය හා කෘත්‍යය ප්‍රකාශ කරයි. | • සත්ත්ව පටක<br>  • අපිච්චද පටක<br>  • සම්බන්ධක<br>  • පේශි පටකය<br>  • ස්නායු පටකය<br>• මිනිස් සිරුර තුල ප්‍රධාන පටක පිහිටි ස්ථාන හා ඒවායේ කාර්යය | පිටු අංක<br>3 - 4 | ජීවීපටක<br>( ශාක පටක 10-16) | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළපොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ජේද ගණන |
|---|---|---|---|---|---|---|
| | 1.3 ප්‍රභාසංස්ලේෂණයේ වැදගත්කම පිළිබඳව අන්වේෂණය කරයි | • ප්‍රභාසංස්ලේෂණය යනු කුමක්දැයි ප්‍රකාශ කරයි.<br>• ප්‍රභාසංස්ලේෂණය සඳහා බලපාන සාධක ප්‍රකාශ කරයි.<br>• ප්‍රභාසංස්ලේෂණයේ අන්ත ඵල හඳුනා ගැනීම සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කරයි.<br>• ප්‍රභාසංස්ලේෂණය සඳහා කාබන්ඩයොක්සයිඩ්,ආලෝක ශක්තිය හා හරිතප්‍රදවල අවශ්‍යතාවය සනාථ කිරීම සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කරයි.<br>• ප්‍රභාසංස්ලේෂණය තුලිත රසායනික සමීකරණයක් මගින් ප්‍රකාශ කරයි.<br>• ප්‍රභාසංස්ලේෂණයේ වැදගත්කම විස්තර කරයි. | • ප්‍රභාසංස්ලේෂණය<br>  • ප්‍රභාසංශ්ලේෂණය කෙරෙහි බලපාන සාධක<br>    • කාබන්ඩයොක්සයිඩ්<br>    • ජලය<br>    • ආලෝක ශක්තිය<br>    • හරිතප්‍රද<br>  • ප්‍රභාසංශ්ලේෂණයේ ඵල<br>  • ප්‍රභාසංශ්ලේෂණයේ කාර්යභාරය | පිටු අංක 5 - 6 | ප්‍රභාසංස්ලේෂණය (පිටු අංක 19 – 27) | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළපොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **නිපුණතාව 2.0:** ජීවිතයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම් සඳහා පදාර්ථ, පදාර්ථවල ගුණ සහ ඒවායේ අන්තර් සම්බන්ධතා අන්වේෂණය කරයි. | | | | | | |
| 2.0 | 2.1<br><br>විවිධ මිශ්‍රණ වර්ග පිළිබඳව අන්වේෂණය කරයි | • මිශ්‍රණ යන පදය පැහැදිලි කරයි.<br>• සමජාතීය සහ විෂමජාතීය මිශ්‍රණ පැහැදිලි කරයි.<br>• සමජාතිය සහ විෂමජාතීය මිශ්‍ර වල ගුණ ලැයිස්තුගත කරයි.<br>• පරීක්ෂණ මත පදනම් ව දී ඇති මිශ්‍රණ සමජාතිය සහ විෂමජාතිය මිශ්‍රණ ලෙස වෙන් කර දක්වයි.<br>• ද්‍රාව්‍යතාවය යන පදය අර්ථ දක්වයි.<br>• ද්‍රාව්‍යතාවය කෙරෙහි බලපාන සාධක සඳහන් කරයි.<br>• ද්‍රාව්‍යතාවය කෙරෙහි බලපාන සාධක පරීක්ෂා කරයි.<br>• එදිනෙදා ජීවිතයේදී ද්‍රාව්‍යතාවය කෙරෙහි බලපාන සාධක පාලනය කරන ආකාරය පිළිබඳ සතිමත් බව පෙන්වයි. | • මිශ්‍රණ<br>  • මිශ්‍රණ වර්ග<br>    • සමජාතීය මිශ්‍රණ<br>    • විෂමජාතීය මිශ්‍රණ<br>• ද්‍රාව්‍යතාව<br>  • ද්‍රාව්‍යතාව කෙරෙහි බලපානසාධක<br>    • ද්‍රාව්‍යයේ ස්වභාවය<br>    • ද්‍රාවකයේ ස්වභාවය<br>    • උෂ්ණත්වය | පිටු අංක 15 - 16 | පිටු අංක 29 - 39 | 04 |
| | 2.2<br><br>මිශ්‍රණයක සංයුතිය ප්‍රකාශ කිරීම සඳහා විවිධ නිර්ණයක භාවිත කරයි | • ද්‍රාවණයක සංයුතිය ස්කන්ධ භාගයක් ලෙස ප්‍රකාශ කරයි.<br>• මිශ්‍රණයක සංයුතිය පරිමා භාගයක් ලෙස ප්‍රකාශ කරයි.<br>• ස්කන්ධය සහ පරිමාව ඇසුරෙන් ද්‍රාවණයක සංයුතිය ප්‍රකාශ කරයි.<br>• මවුල ප්‍රමාණය සහ පරිමාව ඇසුරින් ද්‍රාවණයක සංයුතිය ප්‍රකාශ කරයි. (සාන්ද්‍රණය)<br>• $^{n}/_{v}$ ආකාරයෙන් ප්‍රකාශිත සංයුතිය සාන්ද්‍රණය ලෙස නම් කරයි. | • මිශ්‍රණවල සංයුතිය<br>  • ස්කන්ධ භාගය<br>  • පරිමා භාගය<br>  • $^{m}/_{v}$ මගින් සංයුතිය<br>  • $^{n}/_{v}$ මගින් සංයුතිය ( සාන්ද්‍රණය) | පිටු අංක 17 - 18 | පිටු අංක 39 - 49 | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළපොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • දෙන ලද සංයුතියකින් යුත් මිශ්‍රණයක් පිළියෙල කරයි.<br>• ප්‍රාමාණික ද්‍රාවණ පිළියෙල කරයි.<br>• ප්‍රාමාණික ද්‍රාවණ පිළියෙල කිරීමේ වැදගත්ම අගය කරයි. | | | | |
| | 2.3<br>මිශ්‍රණ වෙන් කිරීම සඳහා විවිධ ක්‍රම ශිල්ප භාවිතා කරයි. | • දී ඇති වෙන් කිරීමේ ශිල්ප ක්‍රම විස්තර කරයි.<br>• විවිධ වෙන් කිරීමේ ශිල්ප ක්‍රම භාවිත කර මිශ්‍රණයක ඇති සංඝටක වෙන් කරයි.<br>• දී ඇති වෙන් කිරීමේ ශිල්ප ක්‍රම භාවිත වන අවස්ථා සඳහා නිදසුන් ඉදිරිපත් කරයි<br>• මුහුදු ජලය මගින් ලුණු නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය විස්තර කරයි.<br>• ලුණු නිෂ්පාදනයේ දී භාවිත කරන වෙන් කිරීමේ ක්‍රමය ඉදිරිපත් කරයි. | • වෙන් කිරීමේ ක්‍රම ශිල්පවල භාවිත<br>  • මුහුදු ජලය මගින් ලුණු නිෂ්පාදනය<br>  • ද්‍රාවක නිස්සාරණය<br>  • සරල ආසවනය<br>  • භාගික ආසවනය<br>  • හුමාල ආසවනය<br>• වෙන් කිරීමේ ක්‍රම ශිල්ප<br>  • යාන්ත්‍රික වෙන් කිරීම<br>  • වාෂ්පීකරණය<br>  • පෙරීම<br>  • ස්ඵටිකීකරණය | පිටු අංක<br>19 - 20 | පිටු අංක<br>50 - 63 | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළපොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **නිපුණතාව 3.0:** විවිධ ශක්ති ආකාර, පදාර්ථ සහ ශක්ති අතරඅන්තර් සම්බන්ධතා, ශක්ති පරිවර්තන ප්‍රශස්ත මට්ටමින් කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස භාවිත කරයි. | | | | | | |
| 3.0 | 3.1<br>යාන්ත්‍රික තරංග සහ විද්‍යුත් චුම්බක තරංගවල ගුණ පිළිබඳව අන්වේෂණය කරයි. | • ක්‍රියාකාරකම් මගින් යාන්ත්‍රික තරංග චලිතය ස්වභාවය ආදර්ශනය කරයි.<br>• තරංග මගින් පදාර්ථ සම්ප්‍රේෂණයකින් තොරව ශක්තිය සම්ප්‍රේෂණය සිදු කරන බව ප්‍රකාශ කරයි.<br>• තීර්යක් තරංග සහ අන්වායාම තරංගවල වෙනස්කම් පැහැදිලි කර සුදුසු උදාහරණ ඉදිරිපත් කරයි.<br>• තරංගයක ප්‍රස්තාරික නිරූපණය භාවිතයෙන් යාන්ත්‍රික තරංග චලිතයේ ස්වභාවය හා තරංග චලිතය හා සම්බන්ධ භෞතික රාශි පැහැදිලි කරයි. (සංඛ්‍යාතය, තරංග ආයාමය, විස්තාරය සහ වේගය) | • තරංග<br>  • යාන්ත්‍රික තරංග<br>    • තීර්යක් තරංග<br>    • අන්වායාම තරංග<br>  • තරංග චලිතය හා සම්බන්ධ භෞතික රාශි<br>    • සංඛ්‍යාතය<br>    • තරංග ආයාමය<br>    • වේගය<br>    • විස්තාරය | පිටු අංක<br>35 - 36 | පිටු අංක<br>68 - 76 | 04 |
| | 3.2<br>එදිනෙදා ජීවිත ක්‍රියාකාරකම් සහ විද්‍යාත්මක කටයුතුවල දී ධ්වනි තරංග පිළිබඳ දැනුම භාවිත කරයි. | • ධ්වනි තරංගවල අන්වායාම ස්වභාවය පැහැදිලි කරයි.<br>• ධ්වනි තරංග සම්පීඩන සහ විරල වලින් සමන්විත බව පැහැදිලි කරයි.<br>• ධ්වනි තරංග සම්ප්‍රේෂණය සඳහා මාධ්‍යයක් අවශ්‍ය වන බව ප්‍රකාශ කරයි.<br>• ඝන,ද්‍රව සහ වායු මාධ්‍යවල තරංග වේගය වෙනස් වන පිළිවෙල ප්‍රකාශ කරයි.<br>• ශ්‍රව්‍යතා සීමාව,අධෝ ධ්වනි සහ අති ධ්වනි සංඛ්‍යාත පිළිබඳව සඳහන් කරයි. | • ධ්වනි තරංග<br>  • ධ්වනි තරංග ප්‍රචාරණ<br>  • ධ්වනි වේගය<br>  • ශ්‍රව්‍යතා පරාස සහ අනිකුත් සංඛ්‍යාත පරාස | පිටු අංක<br>37 - 38 | පිටු අංක<br>84 - 85 | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළපොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | 3.3<br>ජ්‍යාමිතික ප්‍රකාශ විද්‍යාවේ මූලධර්ම සහ නියම එදිනෙදා ජීවිත අවශ්‍යතා සහ විද්‍යාත්මක කටයුතු සඳහා භාවිත කරයි. | • වක්‍ර දර්පණවල ප්‍රතිබිම්බ පිළිබඳව අන්වේශනය කිරීම සඳහා ක්‍රියාකාරකම් සිදු කරයි.<br>• වක්‍ර දර්පණයක ධ්‍රැවය , වක්‍රතා කේන්ද්‍රය, නාභිය සහ ප්‍රධාන අක්ෂය හඳුනා ගනියි.<br>• උත්තල සහ අවතල දර්පණ මත පතිත වන පහත දැක්වෙන කිරණවල හැසිරීම පැහැදිලි කිරීම සඳහා පරාවර්තන නියම යොදා ගනියි.<br>  • ප්‍රධාන අක්ෂයට සමාන්තරව පැමිණෙන කිරණය<br>  • වක්‍රතා කේන්ද්‍රය හරහා ගමන් ගන්නා කිරණය<br>  • නාභිය හරහා ගමන් ගන්නා කිරණය<br>• උත්තල දර්පණවල ප්‍රතිබිම්බ නිර්මාණය කිරීම සඳහා කිරණ සටහන් අඳියි.<br>• අවතල දර්පණවල පහත දැක්වෙන ස්ථානවල ප්‍රතිබිම්බ නිර්මාණය කිරීම සඳහා කිරණ සටහන් අඳියි.<br>$(u \to \infty, u > r, u = r,$<br>$f < u < r, u = f, u < f)$<br>• අදාළ අවස්ථාවල දී වක්‍ර දර්පණ භාවිත කරයි. | • ජ්‍යාමිතික ප්‍රකාශ විද්‍යාව<br>  • පරාවර්තනය<br>    • වක්‍ර දර්පණ (ගෝලීය)<br>    • වක්‍ර දර්පණ හා සම්බන්ධ පද<br>    • වක්‍ර දර්පණවල ප්‍රතිබිම්බ<br>      • උත්තල දර්පණ<br>      • අවතල දර්පණ | පිටු අංක<br>39 -41 | පිටු අංක<br>102 - 116 | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළපොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • උත්තල කාච සහ අවතල කාචවලින් සෑදෙන ප්‍රතිබිම්බවල ස්වභාවය අන්වේෂණය කිරීම සඳහා ක්‍රියාකාරකම් සිදු කරයි.<br>• කාචයක් සඳහා ප්‍රධාන අක්ෂය, නාභිය සහ ප්‍රකාශ කේන්ද්‍රය යන පද පැහැදිලි කරයි.<br>• කාචයක් මත පතිත වන පහත දැක්වෙන කිරණවල හැසිරීම පැහැදිලි කරයි.<br>  • ප්‍රධාන අක්ෂයට සමාන්තර කිරණය<br>  • ප්‍රකාශ කේන්ද්‍රය හරහා කිරණය<br>  • නාභිය හරහා යන කිරණය<br>• අවතල කාචවල ප්‍රතිබිම්බ සඳහා කිරණ සටහන් නිර්මාණය කරයි.<br>• උත්තල කාචවල ප්‍රතිබිම්බ සඳහා පහත දැක්වෙන අවස්ථා සඳහා කිරණ සටහන් නිර්මාණය කරයි.<br>($u \to \infty, u > 2f, u = 2f,$<br>$f < u < 2f, u = f, u < f$)<br>• උත්තල කාච සහ අවතල කාචවල භාවිත සඳහා උදාහරණ ඉදිරිපත් කරයි.<br>• කිරණ සටහනක් භාවිතයෙන් සරල අන්වීක්ෂයයේ ක්‍රියාව පැහැදිලි කරයි. | • වර්තනය<br>  • කාච මගින් ප්‍රතිබිම්බ ඇතිවීම<br>    • උත්තල කාච<br>    • අවතල කාච<br>    • සරල අන්වීක්ෂය | | පිටු අංක<br>123 - 131 | |
| | | | | | සමස්ත එකතුව | 37 |